# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2479/23 - 2026 මාර්තු මස 09 වැනි සඳුදා - 2026.03.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**මහනුවර මහ නගර සභාව, කඩුගන්නාව නගර සභාව, වත්තේගම නගර සභාව, ගඟවටකෝරළේ ප්‍රාදේශීය සභාව, යටිනුවර ප්‍රාදේශීය සභාව, අකුරණ ප්‍රාදේශීය සභාව, කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව, තුම්පනේ ප්‍රාදේශීය සභාවෙන් කොටසක්, හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව, පාතහේවාහැට ප්‍රාදේශීය සභාව, උඩුනුවර ප්‍රාදේශීය සභාව සහ පාතදුම්බර ප්‍රාදේශීය සභාව යන බල ප්‍රදේශ සඳහා වන විසල් මහනුවර නගර සැලැස්ම අනුමත කිරීම**

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය, බිමල් නිරෝෂන් රත්නායක වන මා හට 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2024 අප්‍රේල් මස 09 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, මහනුවර මහ නගර සභාව, කඩුගන්නාව නගර සභාව, වත්තේගම නගර සභාව, ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව, යටිනුවර ප්‍රාදේශීය සභාව, අකුරණ ප්‍රාදේශීය සභාව, කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව, තුම්පනේ ප්‍රාදේශීය සභාවෙන් කොටසක්, හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව, පාතහේවාහැට ප්‍රාදේශීය සභාව, උඩුනුවර ප්‍රාදේශීය සභාව සහ පාතදුම්බර ප්‍රාදේශීය සභාව යන බල ප්‍රදේශ සඳහා වූ විසල් මහනුවර නගර සැලැස්ම අනුමත කරමි.

**බිමල් නිරෝෂන් රත්නායක (පා. ම),**
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය.

2026 පෙබරවාරි මස 5 වන දින,
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය,
6 වන මහල,
"සෙත්සිරිපාය" අදියර - II
බත්තරමුල්ල.

**මහනුවර මහ නගර සභාව, කඩුගන්නාව නගර සභාව, වත්තේගම නගර සභාව, ගඟවටකෝරළේ ප්‍රාදේශීය සභාව, යටිනුවර ප්‍රාදේශීය සභාව, අකුරණ ප්‍රාදේශීය සභාව, කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව, තුම්පනේ ප්‍රාදේශීය සභාවෙන් කොටසක්, හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව, පාතහේවාහැට ප්‍රාදේශීය සභාව, උඩුනුවර ප්‍රාදේශීය සභාව සහ පාතදුම්බර ප්‍රාදේශීය සභාව යන බල ප්‍රදේශ සඳහා වන විසල් මහනුවර නගර සැලැස්ම අනුමත කිරීම**

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද, මහනුවර මහ නගර සභාව, කඩුගන්නාව නගර සභාව, වත්තේගම නගර සභාව, ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව, යටිනුවර ප්‍රාදේශීය සභාව, අකුරණ ප්‍රාදේශීය සභාව, කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව, තුම්පනේ ප්‍රාදේශීය සභාවෙන් කොටසක්, හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව, පාතහේවාහැට ප්‍රාදේශීය සභාව, උඩුනුවර ප්‍රාදේශීය සභාව සහ පාතදුම්බර ප්‍රාදේශීය සභාව යන බල ප්‍රදේශ සඳහා වන විසල් මහනුවර නගර සැලැස්ම 2026 ක් වූ පෙබරවාරි මස 05 වන දින, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය, බිමල් නිරෝෂන් රත්නායක වන මා විසින්, එකී 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8 (උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

**බිමල් නිරෝෂන් රත්නායක (පා. ම),**
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය.

2026 පෙබරවාරි මස 12 වන දින,
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය,
6 වන මහල,
"සෙත්සිරිපාය" අදියර - II
බත්තරමුල්ල.

**මහනුවර මහ නගර සභාව, කඩුගන්නාව නගර සභාව, වත්තේගම නගර සභාව, ගඟවටකෝරළේ ප්‍රාදේශීය සභාව, යටිනුවර ප්‍රාදේශීය සභාව, අකුරණ ප්‍රාදේශීය සභාව, කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව, තුම්පනේ ප්‍රාදේශීය සභාවෙන් කොටසක්, හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව, පාතහේවාහැට ප්‍රාදේශීය සභාව, උඩුනුවර ප්‍රාදේශීය සභාව සහ පාතදුම්බර ප්‍රාදේශීය සභාව යන බල ප්‍රදේශ සඳහා වන විසල් මහනුවර නගර සැලැස්ම අනුමත කිරීම**

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1987 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව මහනුවර මහ නගර සභාව, කඩුගන්නාව නගර සභාව, වත්තේගම නගර සභාව, ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව, යටිනුවර ප්‍රාදේශීය සභාව, අකුරණ ප්‍රාදේශීය සභාව, කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව, තුම්පනේ ප්‍රාදේශීය සභාවෙන් කොටසක්, හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව, පාතහේවාහැට ප්‍රාදේශීය සභාව, උඩුනුවර ප්‍රාදේශීය සභාව සහ පාතදුම්බර ප්‍රාදේශීය සභාව යන බල ප්‍රදේශ සඳහා වන විසල් මහනුවර නගර සැලැස්ම ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය, බිමල් නිරෝෂන් රත්නායක මැතිතුමා විසින්, එකී පනතේ 8 (ඊ) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2026 පෙබරවාරි මස 05 වන දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

**එම්. ජී. හේමචන්ද්‍ර,**
සභාපති
නාගරික සංවර්ධන අධිකාරිය.

2026 පෙබරවාරි මස 12 වන දින,

EOG 03 - 0100

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.